# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2375/21 - 2024 මාර්තු මස 12 වැනි අඟහරුවාදා - 2024.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31ආ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද හලාවත කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම.

**ඩග්ලස් දේවානන්දා,**
ධීවර අමාත්‍ය.

2024 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

හලාවත කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි හලාවත කලපුවේ පාරිසරික තත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත්, ඒ තුළින් කලපුව හා ඒ ආශ්‍රිතව සිදුකරන්නා වූ ජීවනෝපායයන් සුරක්ෂිත කිරීම හා වැඩිදියුණු කිරීමටත්, මෙම නීති රීති, රෙගුලාසි, මූලධර්ම හා ක්‍රියාත්මක ක්‍රමවේදය ඇතුළත් ලියවිල්ල සම්පාදනය කොට ඇත.

මෙම සැලැස්ම හලාවත කලපු සහ-සහභාගිත්ව කමිටුව විසින් අනුමත කොට ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ පසු මෙම සැලැස්ම පනතේ සඳහන් කාරණා හා ඇති අනුකූලතාව විමසා බලා ධීවර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කරනු ලැබේ. (31ආ වගන්තිය)

අමාත්‍යවරයා මගින් මෙම සැලැස්ම අනුමත කොට *ගැසට් පත්‍රයේ* පළකල පසු මෙහි සඳහන් කාරණා ක්‍රියාත්මක තත්වයට පත්වේ (31ආ. 4 වන උපවගන්තිය).

61 වන වගන්තිය යටතේ සුදුසු නියෝග සෑදීමෙන් සහ 34 වන වගන්තිය යටතේ සුදුසු නිවේදන පළකිරීම මගින් සැලසුමේ විධිවිධානවලට අමාත්‍යවරයා විසින් බලාත්මකභාවයක් ලබාදිය යුතුය. (31ආ. 5 වන උපවගන්තිය)

**01. හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව**

2013 අංක 35 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31අ වගන්තියට අනුව, ධීවර අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන කමිටුව මින් මතු හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව යනුවෙන් නම් කරනු ලැබේ. (එහි සංයුතිය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**02. හලාවත කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක වන ප්‍රදේශය**

ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මහවැව, මාදම්පේ, හලාවත හා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් හලාවත කලපු ජල තීරය හා ඊට යාබද හඳුනාගන්නා ලද ග්‍රාම නිලධාරී වසම් 30 කට අයත් වන්නාවූ ගොඩබිම් තීරය (2013 අංක 35 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31(1) වගන්තිය යටතේ අංක 1964/3 සහ 2016.04.25 වන දින *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත හලාවත කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශය ලෙස හැඳින්වේ.)

භූගෝලීය වපසරිය - ජී.පී.එස්. දත්ත ඇතුළත් සිතියම මගින් හලාවත කලපුව තුළ හඳුනාගන්නා ලද, කලපු ප්‍රදේශය පැහැදිළි කෙරෙනු ඇත. (ඇමුණුම් අංක 02)

හලාවත කලපුවේ හඳුනාගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම්:

1. 531 A තොඩුවාව උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය
2. 532 ඉරණවිල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය
3. 532 A ඉරණවිල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය

හලාවත කලපුවේ හඳුනාගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම්:

1. 560 පම්බල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය
2. 560 A පම්බල ග්‍රාම නිලධාරී කොට්ඨාසය
3. 534 C ගලහිටියාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය

හලාවත කලපුවේ හඳුනාගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම්:

1. 561 කාක්කපල්ලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය
2. 562 අඹකඳවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසය
3. 562 A වැලිහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසය
4. 563 පහළ ඔළිඳළුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය
5. 566 මැරවල ග්‍රාම නිලධාරී කොට්ඨාසය
6. 566 B මයික්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසය
7. 566 C ඉනිගොඩවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසය
8. 575 A කුරුසපාඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය
9. 575 C එගොඩවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය
10. 576 අළුත්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය
11. 576 A අළුත්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය
12. 577 වෙරළබඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය
13. 578 A දකුණු පිටිපන ග්‍රාම නිලධාරී කොට්ඨාසය
14. 578 B උතුරු පිටිපන ග්‍රාම නිලධාරී කොට්ඨාසය
15. 579 වට්ටක්කල්ලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය
16. 579 B දැදුරුඔය ග්‍රාම නිලධාරී කොට්ඨාසය

හලාවත කලපුවේ හඳුනාගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම්:

1. 591 බත්තුළුඔය ග්‍රාම නිලධාරී කොට්ඨාසය
2. 590 ආනවිළුන්දාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය
3. 589 සුරවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසය
4. 585 B වෛරන්කට්ටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය
5. 583 කුසල ග්‍රාම නිලධාරී කොට්ඨාසය
6. 584 කෝට්ටපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය
7. 582 කරුක්කුපනේ ග්‍රාම නිලධාරී කොට්ඨාසය
8. 573 බංගදෙනිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය

**03. හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව මැදිහත්ව ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම්**

හලාවත කලපුව තුළ හා ඒ ආශ්‍රිත ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ හැකි හෝ කළ යුතු ක්‍රියාකාරකම්/සංවර්ධන යෝජනා ඇතුළත් සැලැස්මක් වාර්ෂිකව සම්පාදනය කොට සැලැස්මේ පෙන්වා දී ඇති මූලධර්ම මත පිහිටා ක්‍රියාත්මක කිරීම.

හලාවත කලපු සහ-සහභාගිත්ව කමිටුවේ සියලු සාමාජිකයන් හා පාර්ශව ආයතන, මෙම සැලැස්ම මත පිහිටා තම සේවාවන් ක්‍රියාත්මක කිරීම හා අදාළ අවසරයන් ලබා දීම සිදු කළ යුතුය.

**04. මූලධර්ම**

කලපු පරිසර පද්ධතියේ සම්පත් කලපු පරිසර පද්ධතියේ ජෛව විවිධත්වය සංරක්ෂණය, වනජීවී හා පරම්පරා අතර සාධාරණත්වය ඉටුවන පරිදි නෙලා ගැනීම, භාවිතය හා පරිභෝජනය සම්බන්ධ තීරණ ගැනීමේදී ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව මගින් පහත දක්වා ඇති මූලධර්ම, හරපද්ධතීන්ට අනුව කටයුතු කළ යුතුය.

- සම්පත් සමානව බෙදී යාම
- නීතිගරුක බව
- සහ සහභාගිත්වය/නියෝජනය
- විනිවිදභාවය
- පරිසර හිතකාමීබව
- කාර්යක්ෂමතාවය හා සඵලදායිත්වය
- වගවීම
- පොදු එකඟතාවය (ජාති/ආගම්/කුල/දේශපාලනික/වෘත්තිය බලය නොසලකා)
- ඵලදායි ප්‍රතිචාරය
- සාමූහිකත්වය
- තිරසර සම්පත් භාවිතය

**5. ආයතනික ව්‍යුහය**

**05. 01. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය**

1. හලාවත කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියුතු කලපු ධීවරයින් ඇතුළත් කලපු ධීවර කළමනාකරණ කමිටු 12 කි. (1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 32 වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර කමිටු ප්‍රකාශයට පත්කිරීමේ අංක 1772/29 සහ 2012.08.22 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* ඇමුණුම 03 යටතේ දක්වා ඇත.)

| | *ධීවර කමිටුවේ නම* | *ලියාපදිංචි අංකය* |
|---|---|---|
| 1.1 | මුතුපන්තිය කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/01 |
| 1.2 | නගුල්එළිය කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/02 |
| 1.3 | අළුත්වත්ත කාර්මෙල් මාතා කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/03 |
| 1.4 | පළුගස්තැන්න කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/04 |
| 1.5 | වැලිහේන කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/05 |
| 1.6 | මැරවල ශා. ජෝශප් කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/06 |
| 1.7 | ඉරණවිල කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/07 |
| 1.8 | අඹකඳවිල කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/08 |
| 1.9 | තාලඩියවැල්ල කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/09 |
| 1.10 | පම්බල ශා.සෙබස්තියන් කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/10 |
| 1.11 | කරුක්කුපනේ කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/11 |
| 1.12 | ශා.මිකායෙල් කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී. කමිටු/හලා. ක/12 |

2. කලපු ධීවර කළමනාකරණ කමිටු 12 වෙන වෙනම සෑම මසකට වරක් එකඟව ඇති දිනයන්හි රැස්වනු ලැබේ.

3. කලපු ධීවර කළමනාකරණ කමිටු 12 තුළ දී නාමයෝජනා සම්මතයෙන් එක් කමිටුවක සාමාජිකයින් එක් අයෙකු බැගින් සාමාජිකයින් 12ක් හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව නියෝජනය කරනු ලැබේ.

4. කලපු ධීවර කළමනාකරණ කමිටු 12 හි වාර්ෂික මහසභාව සෑම වසරකම දෙසැම්බර් මාසයේ දී පවත්වනු ලැබේ.

5. හලාවත කලපු ධීවර කළමනාකරණ කමිටු 12 හි නියෝජනය සහිතව, 2013 අංක 35 දරන පනත මඟින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන අනුව හලාවත කලපුව සඳහා සහ-සහභාගිත්ව කමිටුව පිහිටවනු ලැබේ. එහි සංයුතිය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.

6. හලාවත කලපු කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව සෑම මාස 3 කට වරක් පැවැත්වෙන අතර දිස්ත්‍රික්කයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයා එහි ලේකම්වරයා / කැඳවුම්කරු වශයෙන්ද ධීවර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා දිස්ත්‍රික් ලේකම්වරයාගේ සම සභාපති වශයෙන්ද ක්‍රියාකරනු ලැබේ.

7. අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකදී එම කමිටුව නියමිත කාලයට පෙර වුවද රැස්විය හැකි වන්නේ ය.

7. 1 ආයතනික ව්‍යුහය තුළ තීරණ ගැනීමේ ක්‍රමවේදය:

1. කලපුවේ ජලජීවී සම්පත් නෙළා ගැනීම, භාවිතය හා පරිභෝජනය සම්බන්ධයෙන්, තීරණ ගැනීමේ ක්‍රියාවලිය කලපු ධීවර කළමනාකරණ කමිටු හා හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව විසින් මෙම සැලැස්ම තුළ හඳුනාගෙන ඇති මූලධර්ම හා එකඟතාවන්ට යටත්ව සිදු කළ යුතු ය.

2. හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටු සම සභාපතිවරුන් ලෙස ධීවර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කටයුතු කරනු ලැබේ.

3. කලපුව තුළ ධීවර මෙහෙයුම් කිරීම පිළිබඳව, කලපු ධීවර කළමනාකරණ කමිටු හා/හෝ ධීවර නිලධාරීන් අධීක්ෂණය කළ යුතුය. එහිදී යම් විසඳාගත නොහැකි කරුණු මතු වුවහොත්, එය හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව වෙත යොමු කළ යුතු ය.

4. හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව සඳහා, හලාවත කලපු ධීවර කළමනාකරණ කමිටුවල යෝජනා ඉදිරිපත් කිරීමේදී, ඉදිරිපත් කළ යුතු යෝජනා සම්බන්ධව එක් එක් හලාවත කලපු ධීවර කළමනාකරණ කමිටුව විසින් බහුතර අනුමැතියෙන් යෝජනා ස්ථිර කොට හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව නියෝජනය කරන සාමාජිකයන් විසින් හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවේ සංවාදයට හා තීරණ ගැනීමට ලක්කළ යුතු ය.

5. හලාවත සහ-සහභාගිත්ව කමිටුවේ තීරණය සඳහා, හලාවත කලපු ධීවර කළමනාකරණ කමිටු විසින් ඉදිරිපත් කරන යෝජනා හා අනිකුත් පාර්ශවකරුවන්ගෙන් ඉදිරිපත් වන යෝජනා හලාවත සහ-සහභාගිත්ව කමිටුව තුළ (අංක 7.1.1 ට යටත්ව) සාකච්ඡාවට ගත යුතු ය.

6. කලපු පරිසර පද්ධතියට බලපෑම් වන්නේ යැයි හැඟෙන ආකාරයේ සංවර්ධන යෝජනාවක් හලාවත ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවේ සාමාජික ආයතන හෝ පාර්ශවකරුවන් වෙත අවශ්‍ය අවසරයන් හා සංවාදයන් සඳහා ඉදිරිපත්වීමේදී හෝ එවන් සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක කිරීමේදී, හලාවත ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව වෙතින් අවශ්‍ය අනුමැතිය පළමුව ලබා ගත යුතු වන්නේ ය.

6. 1 එම අනුමැතිය ලබාදීමේදී, ව්‍යාපෘතියට අදාළව මධ්‍යම පරිසර අධිකාරියේ/පළාත් පරිසර අධිකාරියේ අනුමැතියක් (පාරිසරික බලපෑම් ඇගයීමක් / පාරිසරික නිර්දේශයක්) ලබාගන්නා ලෙසත්, ඉන් පසු අදාළ වාර්තාවේ නිර්දේශ හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවේ තාක්ෂණ කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කළ යුතු ය.

6. 2 නියමිත ව්‍යාපෘතියකට පමණක් අදාළ වන තාක්ෂණ කමිටුවක් හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවෙ සාමාජිකයන් අතරින් පත්කිරීම කමිටුව විසින් සිදු කළ යුතු ය.

7. හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව කලපුවට අදාළව ප්‍රධාන අංක 05 යටතේ දක්වා ඇති පරිදි සංවර්ධන සැලැස්මක් සකසා ගත යුතු අතර, එම සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නංවමින්, අධීක්ෂණය, නියාමනය හා පසුවිපරම් කිරීම සඳහා හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව කටයුතු කළ යුතු ය.

**06. කලපුවේ ආරක්ෂිත ස්වභාවික සම්පත් හා පාරිසරික විශේෂිත සංරක්ෂණය**

කලපු කළමනාකරණ ප්‍රදේශය තුළ ඇති ගොඩබිම් තීරය/ කලපු ජලය/ මත්ස්‍යයින්, පක්ෂීන් එහි ඇති ජලජ සම්පත් සහ අනෙකුත් ජලජ ජීවීන් සහ කලපුව තුළ ඇති දූපත්ද ඇතුළුව කඩොලාන පරිසර පද්ධතියේ ඇති සියළුම ශාක ප්‍රජාවන් හලාවත කලපුවට අයත් ස්වභාවික සම්පත් ලෙස නම් කෙරෙනු ඇත.

1. කලපු කළමනාකරණ ප්‍රදේශය තුළ කඩොලාන ශාක විනාශ නොකළ යුතුය. එමෙන්ම යෝග්‍ය පරිදි නැවත කඩොලාන සිටුවිය යුතු ය.

2. අපද්‍රව්‍ය බැහැර කළ යුතු ය.

   I. කලපුවට යාබදව ඇති ඉස්සන් ගොවිපලවලින් කලපුවට ජලය නිකුත් කිරීමේදී සති දෙකකට නොඅඩු කාලයක් ගොවිපලේ ඇති අවසාදිත ටැංකිවල ගබඩා නොකොට කලපුවට නිකුත් නොකළ යුතු ය.

   II. සත්ත්ව ගොවිපල, කර්මාන්තශාලා, හෝටල්, නිවාස, යාත්‍රාවලින් හා ආයතන වලින් බැහැර කරන අපජලය හෝ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රදේශය තුළට බැහැර නොකළ යුතු ය.

   III. ආහාරයට ගන්නා මසුන් හැර අනෙකුත් සියලුම ජීවී හෝ අජීවී සම්පත් හලාවත සහ-සහභාගිත්ව කමිටුවේ අවසරයකින් හෝ අනුමැතියකින් තොරව පර්යේෂණ කිරීම / අත්පත්කර ගැනීම / විනාශ කිරීම / ගොඩ කිරීම යන කාරණා ලෙස සැලකෙන අතර එවන් කිසිඳු ක්‍රියාවක් කලපු සීමාව තුළ හා රක්ෂිත ප්‍රදේශය තුළ සිදු නොකළ යුතු ය.

3. හලාවත කලපුවේ සංවේදී ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

   කලින් කලට කලපුවේ සංවේදී ප්‍රදේශ හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවට නම් කළ හැකි අතර එම ප්‍රදේශවල කිසිදු ධීවර කටයුත්තක් සිදුකළ නොහැක.

**07. හලාවත කලපුව තුළ කළ හැකි හා කළ නොහැකි ක්‍රියාකාරකම් හා සීමාවන්**

1. හලාවත කලපු ධීවරයන්ගේ සාමාජිකත්වයෙන් පිහිටුවා ඇති කලපු ධීවර කළමනාකරණ කමිටු 12 සාමාජිකත්වය ලබා ඇති ධීවරයන්ට පමණක් කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියැලීමට අවසර ඇත.

2. එසේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රාවන් හා මෙහෙයුම් 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතට අනුකූලව ලියාපදිංචි කොට අංක නිසි ලෙස පින්තාරු කොට මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන අදාළ ධීවර මෙහෙයුම් සිදුකළ යුතු ය.

3. කලපුව තුළ සිදුකරන ධීවර මෙහෙයුම් සඳහා ධීවර යාත්‍රා භාවිතා කරන්නේ නම්, ඒ සඳහා භාවිතා කළ හැක්කේ යාන්ත්‍රික නොවන ධීවර යාත්‍රා පමණය.

4. කලපුවේ ධීවර පන්න ක්‍රම-

   1. එලන දැල් (කරමල් දැල්) වල ඇස් ප්‍රමාණය අඟල් එකහමාර (1 1/2") වඩා අඩු නොවිය යුතු අතර එලිය හැකි උපරිම දැල් ප්‍රමාණය ඇස් 3000 ක් දිග දැල් පීස් 10 කි. කලපුවේ කරමල් දැල් මගින් මෙහෙයුම් කටයුතු සිදුකළ හැක්කේ සවස 4.00 සිට උදේ 6.00 දක්වා පමණය.

   2. කලපුවේ ඉස්සන් ඇල්ලීම සඳහා භාවිතා කරනු ලබන ත්‍රිත්ව දැල්වල මැද දැලේ ඇස් ප්‍රමාණය 1/2" ට වඩා අඩු නොවිය යුතු අතර ඉස්සන් ඇල්ලීම සඳහා එලීමට හැකි උපරිම දැල් ප්‍රමාණය ඇස් 3000 ක් දිග දැල් පීස් 20 ක් පමණය. එමෙන්ම අනෙකුත් මසුන් ඇල්ලීමට එලන ත්‍රිත්ව දැල්වල මැද දැලේ ඇස් ප්‍රමාණය 2 1/2" ට වඩා අඩු නොවිය යුතු අතර එලීමට හැකි උපරිම දැල් ප්‍රමාණය ඇස් 3000 ක් දිග දැල් පීස් 12 ක් පමණය. කලපුවේ ත්‍රිත්ව දැල් භාවිතා කළ හැක්කේ සවස 4.00 සිට උදේ 6.00 දක්වා පමණය.

3. පම්බල, මැරවල, කරුක්කුපනේ කලපු කළමනාකරණ කමිටුවල සාමාජිකයන්ට පමණක් මත්ස්‍ය අතු භාවිතා කරමින් ධීවර මෙහෙයුම්වල යෙදිය හැක. එක් මත්ස්‍ය කොටුවක පරිධිය බඹ 25 (මීටර් 450) කට නොවැඩි විය යුතු අතර එක් අයෙකුට නඩත්තු කළ හැකි මත්ස්‍ය අතු සංඛ්‍යාව 8 කට නොවැඩි විය යුතු ය.

4. විසිදැල්, කකුළු දැල්, මරුවැල්, බිලීබෑම මගින් සිදු කරනු ලබන මෙහෙයුම් දවසේ ඕනෑම වේලාවක් තුළ සිදු කළ හැකිය.

5. අළුත්වත්ත කාර්මෙල් මාතා ධීවර කළමනාකරණ කමිටුව විසින් තෝරාගන්නා ලද සාමාජිකයින්ට පමණක් කට්ටුදැල් ධීවර කර්මාන්තය අදාළ කමිටුව විසින් නියම කරනු ලබන ස්ථානවල නියමිත දින වලදී පමණක් සිදුකළ හැකිය.

6. කලපු මෝයේ සිට උතුරින් පිහිටි ඕලන්ද ඇලේ මුතුපංතිය දක්වා යම් කළමනාකරණයක් සහිතව කුඩු දැල් බැඳීම සිදුකළ හැකි අතර කුඩු දැලක් බැඳීමේදී ඇල මාර්ගයේ මැද මීටර් 3 ක පමණ හිස් ඉඩක් තැබිය යුතු ය.

7. එමෙන්ම හලාවත කලපුව තුළ කකුළු තට්ටි යොදා ගැනීමෙන් කරනු ලබන මෙහෙයුම් බෙල්ලන් ගොඩ දැමීමේ මෙහෙයුම්, කඩොලාන පවතින ප්‍රදේශවලින් බැහැරව අතගෑමෙන් මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සිදුකළ හැකිය. රිටකින් ජලයට තැලීමෙන් මසුන් බියගන්වා මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සිදු කළ හැක්කේ මහ කලපු කටේ සිට ඉනිගොඩවෙල, පහළ ඔලිදළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් පටන්ගෙන කලපුවේ දකුණු දෙසට පමණය.

8. ඉහත සඳහන් මෙහෙයුම් වලට පරිබාහිරව වෙනත් කිසිදු ධීවර මෙහෙයුමක් හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කළමනාකරණ කමිටුවේ අවසරයකින් තොරව හලාවත කලපුව තුළ සිදු නොකළ යුතුය. (ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ පර්යේෂණ කටයුතු සඳහා අදාළ නොවේ.)

9. ජලජීවී වගාව-

   1. කුඩු තුළ මසුන් වගාව

      I. කලපුවේ කුඩු තුළ මසුන් වගාව සිදු කළ හැක්කේ කලපු කළමනාකරණ කමිටුවල සාමාජිකයන්ට පමණය.

      II. කුඩු තුළ මසුන් වගාව සිදු කළ හැක්කේ අදාළ කමිටුවේ නිර්දේශය මත හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් පසුවය.

      III. හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් පසු මේ සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙන් මෙහෙයුම් බලපත්‍රයක් ලබා ගත යුතුය.

   2. පොකුණු තුළ ක්‍රියාත්මක කරන ඉස්සන්/ මසුන් වගාව

      I. කළමනාකරණ ප්‍රදේශය තුළ අළුතින් ඉස්සන් වගාව ඇති කිරීමට අවසර දෙනු නොලැබේ.

      II. පොකුණු තුළ ඉස්සන් හෝ මසුන් වගාව අත්හැර දැමූ ස්ථානයක නැවත ක්‍රියාත්මක කිරීමට අදාළ බල ප්‍රදේශයේ කලපු කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

      III. මෙම අනුමැතිය ලැබීමෙන් පසු මේ සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙන් මෙහෙයුම් බලපත්‍රයක් ලබා ගත යුතුය.

**08. හලාවත කලපුවේ ධීවර යාත්‍රා නවත්වා තබන තොටුපලවල්**

1. මුතුපන්තිය කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. ආනවිළුන්දාව අංක 590
   ප්‍රජාශාලාව අසල තොටුපල

2. නගුල්එළිය කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. ආනවිළුන්දාව අංක 590
   පල්ලිය අසල තොටුපල
   වෛරන්කට්ටුව - ග්‍රා.නි.ව. වෛරන්කට්ටුව අංක 585 B

3. කරුක්කුපනේ කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. කරුක්කුපනේ අංක 582
   පෙරියකරුක්කුපනේ
   මැදපාඩුව (පල්ලිය අසල)
   සින්නකරුක්කුපනේ

4. තාලඩියවැල්ල කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. එගොඩවත්ත අංක 575 C, කුරුසපාඩුව අංක 575 A තාලඩියවැල්ල තොටුපල

5. අළුත්වත්ත කාර්මේල් මාතා කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. අළුත්වත්ත අංක 576, අළුත්වත්ත අංක 576 A, මයික්කුලම 566 B
   අළුත්වත්ත තොටුපල
   උතුරු පිටිපන පල්ලිය ඉදිරිපිට පැරණි ඔරු තොටුපල
   මයික්කුලම

6. මැරවල ශා.ජෝශප් කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. මැරවල අංක 566
   මැරවල ජනපදය 1
   මැරවල ජනපදය 2
   මැරවල ජනපදය 3
   හරින්ද්‍ර ප්‍රදේශය

7. පම්බල ශා.සෙබෙස්තියන් කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. පම්බල උතුර අංක 560, පම්බල දකුණ අංක 560 A
   පොදු සුසාන භූමිය ඉදිරිපිට පාර කෙළවර
   සර්වෝදය පාර කෙළවර
   සුළු ධීවර සම්මේලනය අසල

8. වැලිහේන ශා.අන්තෝනි කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. වැලිහේන දකුණ අංක 562 A
   ශා.අන්තෝනි තොටුපල වැලිහේන
   රජවත්ත තොටුපල වැලිහේන

9. පළුගස්තැන්න කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. වැලිහේන දකුණ අංක 562 A
   වොෂින්ටන් පාම් තොටුපල
   තින්තයා තොටුපල (පරණ තොටුපල)

10. අඹකඳවිල කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. අඹකඳවිල අංක 562
   සරප්පුවත්ත තොටුපල
   රියන්සි පාම් තොටුපල
   අඹකඳවිල තොටුපල
   ගංගොඩ තොටුපල

11. ඉරණවිල කලපු ධීවර කළමනාකරණ කමිටුව - ග්‍රා.නි.ව. ඉරණවිල නැගෙනහිර අංක 532 A, ඉරණවිල බටහිර අංක 532, තොඩුවාව උතුර අංක 531 A
   සමිදුගම තොටුපල
   ධීවර ගම්මාන තොටුපල
   තොඩුවාව උතුර

එක් එක් තොටුපලවලින් ක්‍රියාත්මක වන යාත්‍රා සංඛ්‍යාව සීමා කළ හැකිය.

**09. හලාවත කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම**

හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුව විසින් මෙම ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම වසර 3කට වරක් පසු විපරම් කර, සංශෝධන හා යෝජනා සැලැස්මට ඇතුළත් කළ යුතුය. එසේ ඇතුළත් කරන සංශෝධන හා යෝජනා කමිටුව විසින් අනුමත කළ පසු ධීවර අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කොට හලාවත කලපු ධීවර කළමනාකරණ නියෝග මාලාව සඳහා ඇතුළත් කළ යුතු වන්නේය.

**10. හලාවත කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්මේ හඳුන්වාදෙන කාරණා උල්ලංඝනය කළ විට**

කලපුවේ ධීවර කටයුතුවලට හා කලපුවේ පරිසරයට අදාළව මෙම සැලැස්ම තුළ ඇති කාරණා උල්ලංඝනය කළවිට, හලාවත කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවේ සෑම පාර්ශවකරුවකුටම එසේ නීති හා එකඟතාවයන් කඩකරන පුද්ගලයන් හඳුනාගෙන මෙම සැලැස්ම අනුව නිකුත් කරන නියෝග මාලාව හා අදාළ පාර්ශව ආයතනයන්ට ලැබී ඇති අණ පනත් අනුව අවශ්‍ය නීතිමය කටයුතු කළ හැකි වන්නේය.


ඇමුණුම් අංක - 01

2013 අංක 35 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31 අ වගන්තියේ 1 වන හා 2 වන උපවගන්තීන් යටතේ පිහිටවූ හලාවත කලපු ධිවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටුවට ඇතුළත් විය යුතු නිලධරයන් පහත දැක්වේ.

ඉහත ධීවර පනතේ 31 වන වගන්තියේ 2 වන උප වගන්තිය අනුව සහ-සහභාගිත්ව කමිටුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහ-සහභාගිත්ව කමිටුව විසින් තීරණය නරනු ලැබූ කාරණය සැළකිල්ලට ගෙන පහත සඳහන් නිලධරයන් අතුරින් සංස්ථාපනය කළ යුතුය.

1. දිස්ත්‍රික් ලේකම් - පුත්තලම
2. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ හලාවත දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂ සහ නිලධාරීන් දෙදෙනෙක්
3. ප්‍රාදේශීය ලේකම් - මහවැව
4. ප්‍රාදේශීය ලේකම් - මාදම්පේ
5. ප්‍රාදේශීය ලේකම් - හලාවත
6. ප්‍රාදේශීය ලේකම් - ආරච්චිකට්ටුව
7. සභාපති ප්‍රාදේශීය සභාව - නාත්තන්ඩිය
8. සභාපති ප්‍රාදේශීය සභාව - හලාවත
9. සභාපති නගර සභාව - හලාවත
10. සභාපති ප්‍රාදේශීය සභාව - ආරච්චිකට්ටුව
11. නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන නිලධාරියෙකු
12. අධ්‍යක්ෂ - වයඹ පළාත් ධීවර අමාත්‍යාංශය
13. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නම් කරන නිලධාරියෙකු
14. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ සභාපතිවරයා නම්කරන නිලධාරියෙකු
15. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා නම් කරන නිලධාරියෙකු
16. වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නම්කරන නිලධාරියෙකු
17. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නම්කරන නිලධාරියෙකු
18. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නම්කරන නිලධාරියෙකු
19. මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා විසින් නම්කරන නිලධාරියෙකු
20. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා විසින් නම්කරන නිලධාරියෙකු
21. ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම්කරන නිලධාරියෙකු
22. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම්කරන නිලධාරියෙකු
23. නියෝජ්‍ය පොලිස්පති (වයඹ) විසින් නම් කරන පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු
24. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නම්කරන නිලධාරියෙකු
25. නාවික ආඥාපති (වයඹ පළාත) විසින් නම් කරන ලද ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියෙකු
26. පළාත් පාලන කොමසාරිස් (වයඹ පළාත)
27. හලාවත පාරම්පරික කට්ටුදැල් පෙල්ලේ සංගමයේ නියෝජිතයකු
28. පම්බල සුළු ධීවර සම්මේලනයේ නියෝජිතයකු
29. හලාවත සෙඩෙක් සංවිධානයේ නියෝජිතයෙකු
30. ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන සංවිධානයේ නියෝජිතයෙකු
31. හලාවත කලපු ධීවර කළමනාකරණ කමිටු 12 වෙනුවෙන් එක් කමිටුවකින් එක් නියෝජිතයෙකු බැගින් නියෝජිතයන් 12 දෙනෙකු.

ඇමුණුම අංක - 02


Map of Chilaw Lagoon
Scale - 1:100,000
N
Legend
Main Road
Railway
Tank
River / Stream
Chilaw
Town Name
Important Place
Sea
SRI LANKA
Chilaw Lagoon
Prepared by : Special Mapping Unit , Survey Department , Sri Lanka.
Battulu Oya Junction
Anavulundawa Wewa
Rathambala Oya
Suruwila Wewa
Aluth wewa
Senga Oya
Arachchikattuwa Junction
Bambiwila Wewa
Karukkuliya Wewa
Bangadeniya Junction
Deduru Oya
B045
AA003
Thimbilla Wewa
Munneswarama Wewa
B079
Kokkavila Junction
Chilaw
Karawita Wewa
Chilaw Lake
Kakkapalliya Junction
B178
Walahena Wewa
Thambagalla Junction
B432
B059
B247
Uraliyagara Junction

ඇමුණුම අංක - 03

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 32 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන නිවේදනය.

නිවේදනයයි

අංක 1744/4 සහ 2012.02.08 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත හලාවත කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ පහත සඳහන් ධීවර කමිටු පිහිටුවා ලියාපදිංචි කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | *ධීවර කමිටුවේ නම* | *ලියාපදිංචි අංකය* |
|---|---|---|
| 1. | මුතුපන්තිය ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /01 |
| 2. | නගුල්එලිය ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /02 |
| 3. | අලුත් වත්ත කාර්මේල් මාතා ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /03 |
| 4. | පලුගස්තැන්න ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /04 |
| 5. | වැලිහේන ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /05 |
| 6. | මැරවල ශා. ජොශප් ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /06 |
| 7. | නැඟෙනහිර ඉරණවිල දියවර ගම්මානය ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /07 |
| 8. | අඹකඳවිල ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /08 |
| 9. | තාලඩිය වැල්ල ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /09 |
| 10. | පම්බල ශා. සෙබස්තියන් ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /10 |
| 11. | කරුකුපනේ ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /11 |
| 12. | ශා. මිකායෙල් ධීවර කලපු කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/හලා. ක. /12 |

එන්. ඩී. හෙට්ටිආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2012 අගෝස්තු මස 15 වැනි දින,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10.

EOG 03 - 0115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.